සහනාධාර චක්‍රලේඛ අංක - 83/1

අපේ අංකය : සං/01
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2021/03/24.

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන්

**ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සවිබල ගැන්වීම යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය**

උක්ත කරුණට අදාල නිකුත් කර ඇති චක්‍රබ අංක 83 හි කරුණු අංක 2 යටතේ ඇති 2.3.4 ඡේදය හා කරුණු අංක 4 යටතේ ඇති 4 (i) ඡේද පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

**2. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය**

2.3.4 අධිකාරියේ තවාන් 500 ව්‍යාපෘතිය යටතේ සහනාධාර ලබාගෙන ඇත්නම් එම තවානෙහි පැල සංඛ්‍යාව අනුව පැල 25,000 ක් සඳහා රු.250,000/- හෝ පැල 50,000 ක තවානක් සඳහා රු.500,000/- උපරිම සීමාවකට යටත්ව ණය ලබාගත හැක. එම තවාන්වල තවාන් 500 ව්‍යාපෘතිය යටතේ සහනාධාර ලබාගත් පැල සංඛ්‍යාවට වඩා වැඩි ධාරිතාවක් සඳහා තවාන් අවසරපත්‍ර ලබාගෙන පැල නිෂ්පාදනය කරනු ලබන්නේ නම් ඉතිරි පැල ප්‍රමාණය සඳහා 2.3.1 හි සඳහන් සීමාව යටතේ ණය ලබා ගැනීමට හැකියාව ඇත.

**4. වෙනත් කරුණු**

(i) තේ නැවත වගාව, අළුත් වගාව හා පාලු සැපයීම සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ දී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහනාධාර ක්‍රමය යටතේ අවසරපත්‍රයක් ලබා ගැනීම අනිවාර්යය නොවේ. එහෙත් 2020 වසරේ හෝ ඊට පසුව අධිකාරියේ සහනාධාර අවසරපත්‍රයක් ලබා ගෙන පැල සිටුවා නොමැති නම් මෙම ණය මුදල් ලබා ගන්නා අයකු හට ණය මුදලින් සහනාධාර හිමිකම් ලබන මුදල අඩු කොට ඉතිරි මුදල ණය පහසුකම වශයෙන් ලබා ගත හැක.

මහින්ද විදානපතිරණ
සභාපති

පිටපත් :
1.) ලේකම් - වැවිලි අමාත්‍යාංශය
2.) ලේකම් - සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා හා කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
3.) සාමාන්‍යාධිකාරී
4.) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන / ව්‍යාප්ති)
5.) අභ්‍යන්තර විගනක
6.) කළමනාකරු (සැලසුම් හා නියමුකරණ)
7.) සියලුම මාණ්ඩලික නිලධාරීන්
8.) සියලුම කලාප තේ සංවර්ධන නිලධාරීන්
9.) සියලුම තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන්
10.) ගරු සභාපති/ලේකම් සමස්ත ලංකා සමිති සංවිධානය